
**සති පාසල 13**

# දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු.

## මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර



එදිරිවීර සරච්චන්ද්‍ර මහතා 1914 ජුනි මස 03 වන දින ගාල්ලේ දී උපත ලැබී ය. ගල්කිස්සේ ශාන්ත තෝමස්, පානදුර ශාන්ත ජෝන්, ගාල්ලේ ශාන්ත ඇලෝෂියස් යන විද්‍යාලවලින් ඉගෙනුම ලබා කොළඹ විශ්ව විද්‍යාලයට අධ්‍යාපනයට පිවිස ඇත. අවුරුදු ගණනාවක්ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ලෙස ද ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ද කටයුතු කළේ ය.

1940 දශකය වන විට විශ්ව විද්‍යාලය තුළ සිංහල නාට්‍ය පිළිබඳ ව උද්යෝගයක් ඇති කිරීම සඳහා මහාචාර්යය එදිරිවීර සරච්චන්ද්‍රයන් විශාල කැපවීමකින් කටයුතු කළේ ය. සිංහල සාම්ප්‍රධායික ගැමි නාට්‍ය කලාව ආශ්‍රය කර ගනිමින් පර්යේෂණ රාශියක් සිදු කරමින් එතුමා සිංහල නාට්‍යයේ නව ආකෘතියකි බිහි කළේ ය.

1956 දී නාඩගම් කලාවේ ආභාසය ලබා ගනිමින් සිය ප්‍රථම නාට්‍ය වන මනමේ නාට්‍ය නිෂ්පාදනය කරමින් සිංහල නාට්‍ය කලාවට නව ආරම්භයක් ලබා දුන්නේය.

## සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය අංශ හතරක් යටතේ වර්ග කළ හැක.

1. **වෙනත් භාෂාවලින් ලියැවුණු නාට්‍ය ආශ්‍රිත**
    - මුදලාලිගේ පෙරළිය (Le Bourgeois gentilhomme)
    - කපුවා කපෝති (The marriage)
    - හැංගි හොරා (Importance of Being Earnest)
    - වළහා (Bear)
    - මඟුල් ප්‍රස්ථාව (Proposal)
    - මැනේජර් (The Anniversary)
    - වෙද හටන (නියුමාන් ජුබාල් සමඟ) (Malady Imaginaries)

2. **ජනකතා පුරාවෘත හා වෙනත් කතා**
    - සිංහබාහු
    - පේමතෝ ජායතී සෝකෝ (ස්වර්ණතිලකා හා උද්දාල කතාව)
    - හස්තිකාන්ත මන්තරේ (උදයන හා වාසුලදත්තා කතාව)
    - වෙල්ලවැහුම්
    - ඒකට මට හිනා හිනා
    - එලොව ගිහින් මෙලොව ආවා

3. **ජාතක කතා පදනම් කොටගත් නාට්‍ය**
    - පබාවති - කුස ජාතකය
    - වෙස්සන්තර - වෙස්සන්තර ජාතකය
    - මනමේ - චුල්ල ධනුද්ධර ජාතකය
    - ලෝමහංස - මහා පදුම ජාතකය
    - කදා වළලු - සේරිවාණිජ ජාතකය
    - බව කඩතුරාව - ස්වර්ණ හංස ජාතකය

4. **ස්වතන්ත්‍ර නාට්‍ය**
    - වඳින්න ගිය දේවාලය
    - බහින කලාව

- වටපුළුවේ ගෙවල් බිඳලා

## එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණ

- 1954 දී ගුවන් විදුලිය නාට්‍යයක් ලෙස ප්‍රචාරය වූ, 1958 දී වේදිකා නාට්‍යයක් ලෙස නිෂ්පාදනය කෙරුණු

### රත්තරං නාට්‍ය

දේශීය තොවිල් සම්ප්‍රදාය ආශ්‍රය කර ගැනීම, මිනිස් දුබලතා විනිවිද දැකීම, තෘෂ්ණාව හා වෛරය මිනිසා විනාශය කරා මෙහෙයවන ආකාරය, ගැමි කතා වස්තුවක් යොදා ගැනීම, හාස්‍යෝත්පාදක නාට්‍යයක් වීම මෙහි දක්නට ලැබේ.

### කදා වළලු නාට්‍ය

මුල දී ගුවන් විදුලි නාට්‍යයක් ලෙස **රත්තලයේ කතාව** නමින් ප්‍රචාරය වූ මෙය 1958 දී නිෂ්පාදනය කෙරුණු නාට්‍යයකි. සේරිවාණිජ ජාතකය ආශ්‍රය කර ගැනීම, නාඩගම් සම්ප්‍රදායයෙන් නාට්‍යයක් වීම දක්නට ලැබේ.

### එලොව ගිහින් මෙලොව ආවා - 1959

ගායන සම්ප්‍රදාය යොදා ගැනීම, නාට්‍යමය උද්දීපනය කිරීම සඳහා නර්තනය භාවිත කිරීම, ගැමි ජන රංගනයෙන් ආභාසය ලැබීම, හාස්‍ය හා උපහාසය මුඛ්‍ය රසය කර ගැනීම, ගැමි ජන විඥාණය නිරූපණය කිරීම මෙහි දක්නට ලැබේ.

### වෙල්ලවැහුම් - 1960

ගැමි ජන රංගනයේ ආභාසය ලබා ගැනීම, ජන කතාවක් උපයෝගී කර ගැනීම, උත්ප්‍රාසය කුළු ගැන්වීම, ජීවිතය පිළිබඳ ව ඇති ගැමියාගේ උපේක්ෂාවාදී දෘෂ්ටිය මෙහි දැකිය හැක.

## හස්තිකාන්ත මන්තරේ - 1960

ස්වතන්ත්‍ර නිර්මාණයක් වීම, පාලකයන්ගේ හා උපදේශකයන්ගේ මානසිකත්වය අතර ඇති වන අසංවිහිත හා අසංතුලිතභාවය පිළිබිඹු වීම, රාජ්‍ය පාලකයාගේ බුද්ධිය අවමානයට පාත්‍ර වීම, කාලීන තේමාවක් සහිත වීම, හාස්‍ය ජනිත වීම, උපහාසය ධ්වනිත වීම වැනි ලක්ෂණ මෙහි දක්නට ලබේ.

## ඒකට මට හිනා - 1961

උම්මග්ග ජාතකයේ සඳහන් කාලගෝල කථා වස්තුව ඇසුරින් නිර්මාණය වීම, ජන කථා සාම්ප්‍රධාය භාවිතා කිරීම, සියුම් හාස්‍ය ජනනය කිරීම, විරිඳු ගායනා යොදා ගැනීම මෙහි දක්නට ලැබේ.

## සිංහබාහු - 1961

මනමේ නාට්‍ය යන් පසු බිහි වූ නාට්‍ය කලාවේ සුවිශේෂ සන්ධිස්ථානයක් වීම, නාට්‍ය ධර්මී සාම්ප්‍රධාය, රසිකයන්ට උසස් ම කාව්‍යමය හා සංගීතමය ආස්වාදයක් ලබා දීම, විශිෂ්ට දෘශ්‍ය කාව්‍ය ලක්ෂණ පළ කිරීම, නාඩගම් ශෛලියේ තවත් අත්හදා බැලීමක් වීම, විශ්ව වටිනාකමක් සහිත වස්තුවක් තෝරා ගැනීම, පරම්පරා දෙකක සිතුම් පැතුම් හා මතිමතාන්තර අතර පවත්නා පරස්පර බව හුවා දැක්වීම, කලාත්මක හා මනෝවිද්‍යාත්මක දෘෂ්ටියක් සහිත වීම ආදී විශේෂතා රාශියක් මෙම නාට්‍යයෙහි දක්නට ලැබේ. පිය-පුතු සෙනෙහස, අඹු සැමි සෙනෙහස ආදී මානව සම්බන්ධතා ඉස්මතු කිරීම, සුවිශේෂ චරිත නිර්මාණයක් සිදු කිරීම, ක්‍රෝධය, වෛරය වැනි දූෂිත චිත්ත ස්වභාවයන් හමුවේ පිවිතුරු සිතිවිලි නිසා හටගත් අචල ශක්තිය දෙදරා යන ආකාරට ආදී කරුණු ද සිංහබාහු නාට්‍ය තුළින් ඉස්මතු වේ.

## මහාසාර නාට්‍ය - 1968

සත්ත්ව සංහතියට අවේණික ලක්ෂණ විවරණය කිරීම, ස්ත්‍රී චිත්ත ස්වභාවය විවරණය කිරීම ආදී ලක්ෂණ මෙම නාට්‍යයේ දක්නට ලැබේ.

## පේමතෝ ජායතී සෝකෝ - 1969

ගීත නාට්‍යයක් ලෙස රචනා වීම, දේශීය සංගීතයට හානි නොවන සේ බටහිර ලක්ෂණ යොදා ගැනීමට උත්සාහ කිරීම, ඔපෙරා ලක්ෂණ දේශීය උරුවට ගැලපෙන සේ යොදා ගැනීමට උත්සාහ කිරීම ආදිය ඉස්මතු කෙරෙන මෙම නාට්‍යයේ ප්‍රේමය හා බැඳි තෘෂ්ණාව විසින් මනස මෙහෙයවනු ලබන ආකාරය හා ප්‍රේමය බිඳ වැටීමේ දී අත් විඳින විප්‍රලම්භය ද ප්‍රකට වේ.

## වෙස්සන්තර ගීතාංග නාටකය - 1980

නව සමාජ පරිවර්තනව නිසා මිනිස් චර්යාව වෙනස් වෙමින් පාරම්පරික සාරධර්ම තර්ජනයකට ලක් ව ඇති අවස්ථාවේ පරාර්ථ චර්යාව පිළිබඳ ව සමාජය අවධි කිරීමේ අරමුණකින් ලියැවුණකි. රාජ්‍ය පාලනයේ දී තනි තීරණ ගැනීම, පොදු වස්තූන් පරිහරණය කිරීම ආදිය නිසා ගැටලු ඇතිවන ආකාරය, මහජන කැළඹීම් නිසා ගැටලු ඇති වන ආකාරය ආදියත්, පරමාදර්ශී රාජ චරිතයක් යනු කවරේ ද යන්නත් පෙන්වාදෙමින් දේශපාලනයේ එන දෙබිඩි චරිත සරදමට ලක් කිරීම මෙයින් සිදු කොට ඇත.

## ලෝමහංස - 1985

වියපත් පුරුෂයෙකු තරුණ ස්ත්‍රියක පාවා ගැනීමෙන් සිදු වන ව්‍යවසනය කියා පාන්නකි.

## බව කඬතුරාව - 1989

ස්වර්ණහංස ජාතකය ඇසුරින් නිපදවා තිබේ. සමාජ අරගලය ප්‍රබල සංකල්ප රූප මඟින් ඉදිරිපත් කරයි. අල්පේච්ඡ බව, ලද දෙයින් සතුටු වීම, පරෝපකාරය, දයාව, කරුණාව ආදී උතුම් පුරුෂාර්ථ, භෞතික සම්පත් කෙරෙහි ඇති ආසක්ත බව නිසා වෙනස් වන ආකාරය මින් නිරූපිත වේ.

## පැවරුම

1. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ කොටස් කීයක් යටතේ වර්ග කෙරේ ද?

2. එම නාට්‍ය වර්ග නම් කර එම වර්ගවලට අයත් නාට්‍ය නිර්මාණ හතර බැගින් ලියන්න.

3. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ගැන පුවත් පතකට ලිපියක් ලියන්න.